# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1150 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 13/07/2024 පැය 0630

## මාධ්‍ය නිවේදනය

**මනුෂ්‍ය ඝාතනයක් - වීරකැටිය පොලිස් වසම.**

2024.07.12 වන දින රාත්‍රී කාලයේ වීරකැටිය පොලිස් වසමේ මොරයාය හන්දිය අසල පැවති සංගීත සංදර්ශනයක් අතරතුර දෙපිරිසක් අතර ඇතිවූ ගැටුමකින් පුද්ගලයින් 06 දෙනෙකු තුවාල ලබා වීරකැටිය හා තංගල්ල රෝහල් වලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී එක් පුද්ගලයෙකු මියගොස් ඇති බවට වීරකැටිය පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 30 ක් වූ මොරයාය දකුණ, වැකඳවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සංගීත සංදර්ශනය නැරඹීම සඳහා පැමිණි පිරිසක් සංදර්ශණ භූමියේ සිටි සාරවිට වෙළෙන්දෙකු අතර ඇතිවූ ආරවුලක් විසදීම සඳහා සංවිධායක මණ්ඩලයේ අයෙකු මැදිහත්ව ඇත. එම පිරිස විසින් ඔහුට පහරදීම හේතුවෙන් සංවිධායක මණ්ඩලයේ අය විසින් පිහියකින් පහරදී 06 දෙනෙකු තුවාල ලබා ඇති අතර ඉන් එක් අයෙකු වීරකැටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත. තුවාලකරුවන් සිව් දෙනෙකු තංගල්ල රෝහලේ හා තවත් අයෙකු ඇඹිලිපිටිය රෝහලේ ප්‍රතිකාර ලබයි.

මෘත ශරීරය වීරකැටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඝාතනය සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත. වීරකැටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**